මගේ අංකය - පීසීඑස්/පී/12/2017

සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

සුවසිරිපාය

පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත

කොළඹ 10.

2017.08.

සියලුම පළාත් සෞඛ්‍ය සේවා ලේකම්වරුන් ,

සියලුම පළාත් / නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

සියලුම ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන්,

සියලුම විශේෂිත ව්‍යාපෘති ප්‍රධානීන්,

පළාත් රෝහල්, දිස්ත්‍රික් මහා රෝහල් සහ මූලික රෝහල් වෛද්‍ය අධිකාරිවරුන්.

සියලුම වෛද්‍ය පරිපාලන නිලධාරීන්-සෞඛ්‍ය අමාත්‍යාංශය

## <u>පරිපාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සඳහා විදේශගතවීමට ඉපැයූ නිවාඩු ප්‍රධානය කිරීම</u>

2018 වර්ෂය තුල ඉපැයූ නිවාඩු ලබා ගැනිමට හැකියාව ඇති සහ ඒ සඳහා කැමැත්තක් දක්වන පරිපාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ අයදුම්පත්‍ර හා අමුණා ඇති ආකෘති පත්‍රයට අනුව සකස් කල යුතු අතර, අධ්‍යක්ෂ (ජාත්‍යන්තර සත්කාර සේවා) සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, සුවසිරිපාය, අංක 385, කොළඹ 10 යන ලිපිනයට ලැබෙන සේ 2017.[illegible].6 දින හෝ ඊට පෙර එවිය යුතුය. තවද පොදු 126 ආකෘති පත්‍රය (විදේශ නිවාඩු සඳහා ඉල්ලුම්පත්‍රය) අදාල නිලධාරියා විසින් නිසි පරිදි සම්පූර්ණකොට අයදුම්පත්‍රය සමග සාමාන්‍ය ආකාරයට එවිය යුතුය.

2) ලබාගෙන ඇති විදේශ නිවාඩු පිලිබද සියලු තොරතුරු (උදා : විවේක , සම්පූර්ණ , වැටුප් සහිත අධි ශිෂ්‍යත්ව ආදිය) අයදුම් පත්‍රයෙහි ඇතුලත් කල යුතුය.

3) මෙම නිවාඩු අදාල වසර තුල භාවිතා කල යුතු බැවින් තෝරා ගනු ලබන එම නිලධාරීන් 2018 ජූනි 30 දිනට පෙර දිවයිනෙන් බැහැර විය යුතුය.

4). ඉපැයූ නිවාඩු ලබාදීම සඳහා තෝරා ගනු ලබන නිලධාරීන්ගෙන් ලැයිස්තුව ප්‍රකාශයට පත්කොට මාස 03ක් ඇතුලත තමා නිවාඩු ලබා ගන්නේද යන වග ඔහු / ඇය විසින් සෞඛ්‍ය පෝෂණ හා දේශීය අමාත්‍යාංශයට දැනුම් දිය යුතුය. නියමිත කාලය තුල නිවාඩු භාර ගැනිම දැනුම් දීමට නිලධාරියෙකු අසමත් වූ විටෙක, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් ලැයිස්තුවේ ඊළග නිළධාරියාට ඉපැයූ නිවාඩු ප්‍රදානය කරනු ඇත. 2018 ජූනි 30 ට පෙර විදේශ ගත වීමට නිලධාරියා අසමත් වුවහොත් ප්‍රදානය කරන ලද ඉපැයූ නිවාඩු ඔහුට හෝ ඇයට අහිමි වන අතර, ඉදිරි වසර දෙක සඳහා සලකා බලනු නොලැබේ.

5) ඉපැයූ නිවාඩු ප්‍රදානය සඳහා වයස අවුරුදු 55 වැඩි නිලධාරීන්ටද සලකා බැලෙන බව අවධාරනය කෙරේ.

6) මෙම ලිපියේ අන්තර්ගත කරුණු පිළිබද ඔබ ආයතනයේ අදාල සියලු නිලධාරීන්ගේ අවධානය යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

**වෛද්‍ය ලක්ෂ්මි සී සෝමතුංග**

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සේවා) 1

…1 සෝමතුංග
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සේවා)1
සෞඛ්‍ය අමාත්‍යාංශය
''සුවසිරිපාය''
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ 10

# ඉපැයූ විදේශ නිවාඩු සඳහා ආදර්ශ අයදුම් පත්‍රය 2018

1. නිලධාරියාගේ නම : ……………………………………………………………………

2. උපන් දිනය - වර්ෂය …………… මාසය …………… දිනය ……………………

3. තනතුර ……………………………………………………………………………

4. වර්තමාන රාජකාරි ස්ථානය ……………………………………………………………

5. වර්තමාන ශ්‍රේණියට පත්වීම ලද දිනය ……………………………………………………

6. විශේෂඥතාවය තිබේ නම් සහ එයට පත්වීම් ලද දිනය ……………………………………

7. දින කාලය සහ අරමුණු සහිතව ලබාගෙන ඇති විදේශ නිවාඩු පිළිබඳ විස්තරය

……………………………………………………………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………

8. (අ) නිවාඩු ආරම්භ කිරීමට අපේක්ෂිත දින සහ කාලය

(ආ) නිවාඩු ලබා ගැනීමට අපේක්ෂිත අරමුණ ……………………………………

……………………………………………………………………………………

……………………………………………………………………………………

9. දුරකථන අංකය ……………………………………………………………………

10. විශේෂ ඉල්ලීම ……………………………………………………………………

……………………………………………………………………………………

…………………………

අයදුම්කරුගේ අත්සන

දිනය 20 / /

ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

…………………………

ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය 20 / /

විමධ්‍යගත අංශ ප්‍රධානියාගේ නිර්දේශය

…………………………

විමධ්‍යගත අංශ ප්‍රධානියාගේ අත්සන

දිනය 20 / /